# සල්ලෙඛ ප්‍රතිපත්තිය නම් කුමක් ද?

විද්‍යා විශාරද රාජකීය පණ්ඩිත
**ඉඳුරුවේ උත්තරානන්දාභිධාන**
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අතිපූජ්‍ය මහානායක
මාහිමිපාණන් වහන්සේ විසිනි.

සසර උපතට හා පැවැත්මට මුල්වන ලොභාදි ක්ලෙශයන් ලියා හරින - සිඳබිඳ හරින සලේ පැවැත්ම සල්ලෙඛ ප්‍රතිපත්තිය නම් වේ. මේ ප්‍රතිපත්තිය කෙළින්ම නිවනට මුල් වන පිළිවෙත යි. ශරණ ගමනයෙහි පටන් පුරන සිල් වතපිළිවෙත නිවන අරමුණු කොට ම පවත්නා බැවින් සල්ලෙඛ ප්‍රතිපත්තියට අයත් වෙයි. බුදු සසුනෙන් බැහැර තවුස් කම් කරනුවන් විසින් උපදවා ගත් ප්‍රථමධ්‍යානාදී සමාපත්තිය සසරට ම මූල්වන බැවින් - පාදක වන බැවින් සලේ පැවැත් ම නම් නො වෙයි. බුදුසසුනෙහි වුවද විදර්ශනාවට පාදක නොවන ප්‍රථමධ්‍යානාදීන්ගේ විහාරය ධ්‍යානසුඛයෙන් කල් යැවීම සල්ලෙඛය නො වෙයි. බුදුසමයෙහි අධිමානික භික්ෂුවගේ අෂ්ටසමාපත්තිලාභය ද සල්ලෙඛ විහාරය නො වෙයි. ඒ භික්ෂුනම ධ්‍යාන යට සමවැද ඉන් නැඟිට සංස්කාරධර්ම යන් සංමර්ශනය නො කරන බැවිනි. සිතෙහි එකඟ බව පමණක් සිදු කරන ඒ භික්ෂුනමගේ ඒ රූපධ්‍යානය වනාහි දිට්ඨධම්මසුඛවිහාරය විසින් ද අරූප ධ්‍යානය සන්තවිහාරය විසින් ද මේ ශාසනයෙහි බැවහර කරනු ලැබේ. සල්ලෙඛ විහාරය නම් නො වේ.

ලොභාදි ක්ලෙශයන් ලියා හරින පිළිවෙත විදසුන් පදනම් කොට ගෙන ම වුව මැනැවි. යම් කිසිවක්හු තිසරණ පන්සිල් ගතුවත් අටසිල් දසසිල් ගතුවත් හෙරණ සිල් උපසපන් සිල් ලැබුවත් දූහඟවත් පිරුවත් පසබිනැණ අටසමවත් ලැබුවත් හෙතෙමේ කෙලෙසුන් ලිහා හරින්නට වෑයම් නො කරයි නම් සල්ලෙඛ ප්‍රතිපත්තිය නො පුරයි. සල්ලෙඛය පුරන්නා විසින් මෙසේ මෙනෙහි කළයුතු යි.

(අ) අනුන් හිංසකයන් වුව ද අප අහිංසකයන් වුව මැනවැයි නිති උදය සවස මෙනෙහි කළයුතු යි. අනුන් පරපණ නසන්නන් වුව ද අප පරපණ නොනසන්නන් වුව මැනැවැයි ද අනුන් සොර කම් කරන්නන් වුව ද අප සොරකම් නො කරන්නන් වුව මැනැවැයි ද, අනුන් නො බඹසැරියන් වුව ද අප බඹසැරියන් වුව මැනැවැයි ද, අනුන් බොරුකියන්නන් වුව ද, අප බොරු නො කියන්නන් වුව මැනැවැයි ද, අනුන් කේළාම් කියන්නන් වුව ද අප කේළාම් නො කියන්නන් වුව මැනැවැයි ද, අනුන් රළුබස් දෙඩන්නවුන් වුව ද අප රළුබස් නො දෙඩන්නවුන් වුව මැනැවැයි ද, අනුන් හිස් තෙපුල් තෙප ලන්නන් වුව ද අප හිස් තෙපුල් නො තෙපලන්නන් වුව මැනැවැයි ද, අනුන් දැඩිලෝබකම් ඇතියන් වුව ද අප දැඩි ලෝබකම් නැතියන් වුව මැනැවැයි ද, අනුන් මෙරමා නසන වනසන සිතුම් පැතුම් ඇතිවැ සිටියන් වුව ද අප මෙත් සිතින් යුතු වැ වසන්නන් වුව මැනැවැයි ද; අනුන් මිසදිටුවන් වුව ද අප සම් දිටුවන් වුව මැනැවැයි ද නිතර නිතර මෙනෙහි කළයුතු යි සිත්හි ලා දැරියයුතු යි.

(ආ) මෙරමා වැරදි දකුම් ඇතියන් වුව ද අප නිවැරදි දකුම් ඇතියන් වුව මැනැවැයි ද, මෙරමා වැරදි කල්පනා ඇතියන් වුව ද අප නිවැරදි කල්පනා ඇතියන් වුව මැනැවැයි ද, මෙරමා වැරදි වචන ඇතියන් වුව ද අප නිවැරදි වචන ඇතියන් වුව මැනැවැයි ද, මෙරමා වැරදි කටයුතු ඇතියන් වුව ද අප නිවැරදි කටයුතු ඇතියන් වුව මැනැවැයි ද, මෙරමා වැරදි දිවිපෙවෙත් ඇතියන් වුව ද අප නිවැරදි දිවිපෙවෙත් ඇතියන් වුව මැනැවැයි ද, මෙරමා වැරදි වැයම් ඇතියන් වුව ද අප නිවැරදි වැයම් ඇතියන් වුව මැනැවැයි ද, මෙරමා වැරදි සිහි ඇතියන් වුව ද අප නිවැරදි සිහි ඇතියන් වුව මැනැවැයි ද, මෙරමා වැරදි එකඟකම ඇතියන් වුව ද අප නිවැරදි එකඟ කම ඇතියන් වුව මැනැවැයි ද, මෙරමා වැරදි නුවණ ඇතියන් වුව ද අප නිවැරදි නුවණ ඇතියන් වුව මැනැවැයි ද, මෙරමා වැරදි මිදීම් ඇතියන් වුව ද අප නිවැරදි මිදීම් ඇතියන් වුව මැනැවැයි ද දිවා රෑ දෙක්හි මෙනෙහි කළයුතු යි. සල්ලෙඛය කළ යුතුයි.

(ඉ) අන් පුහුලන් ථීන මිද්ධයෙන් මඩනාලදුවන් වුව ද අප ථීන මිද්ධයෙන් නො මඩනාලදුවන් වුව මැනැවැයි ද, අන් පුහුලන් උද්ධතයන් - නො සන්සුන් සිත් ඇතියන් වුව ද අප අනුද්ධතයන්-සන්සුන් සිත් ඇතියන් වුව මැනැවැයි ද, අන්‍යයන් විචිකිච්ඡා ඇතියන් වුව ද අප පහකළ විසිකිස් ඇතියන් වුව මැනැවැයි ද, අන් පුහුලන් කිපෙන සුල්ලන් වුව ද අප නො කිපෙන සුල්ලන් වුව මැනැවැයි ද, අනුන් බැඳගත් වෙර ඇතියන් වුව ද අප බැඳගත් වෙර නැතියන් වුව මැනැවැයි ද, අනුන් ගුණමකුවන් වුව ද අප ගුණමකුවන් නුවුවමැනැවැයි ද, අන්‍ය පුද්ගලයන් යුග ග්‍රාහකයන් වුව ද අප යුග ග්‍රාහකයන් නුවුව මැනැවැයි ද, අනුන් ඉසිකරන්නන් වුව ද අප ඉසි නො කරන්නන් වුව මැනැවැයි ද, අන් පුහුලන් මසුරුසිත් ඇතියන් වුව ද අප නො මසුරු සිත් ඇතියන් වුව මැනැවැයි ද, අනුන් කෛරාටිකයන් වුව ද අප කෛරාටිකයන් නුවුව මැනැවැයි ද, අන්‍යයන් මායා ඇතියන් වුව ද අප මායා නැතියන් වුව මැනැවැයි ද, අනුන් තදබව ඇතියන් වුව ද අප තදබව නැතියන් වුව මැනැවැයි ද, අනුන් අධිකමාන ඇතියන් වුව ද අප අධිකමාන නැතියන් වුව මැනැවැයි ද, අනුන් දුර්වචන ඇතියන් වුව ද අප සුවචයන් වුව මැනැවැයි ද, අනුන් පව්ටු මිතුරන් ඇතියන් වුව ද අප කලණමිතුරන් ඇතියන් වුව මැනැවැයි ද, අනුන් ප්‍රමත්තයන් වුව ද අප අප්‍රමත්තයන් වුව මැනැවැයි ද නිති උදය සවස දෙක්හි සල්ලෙඛය කළයුතු යි. මෙනෙහි කළ යුතු යි.

(ඊ) මෙසේ මෙනෙහි කරන සල්ලෙඛියා වැඩිදුරටත් මතු සඳහන් පරිදි නුවණින් සැලකියයුතු යි. අනුන් සැදැහැ නැති පුහුලන් වුව ද අප සැදැහැතියන් වුව මැනැවැ. අනුන් අහිරික (පවට ලජ්ජා නැති) පුහුලන් වුව ද අප හිරික (පවට ලජ්ජා ඇති) යන් වුව මැනැවැ. මෙරමා ඔතප් (පවට බිය) නැති පුහුලන් වුව ද අප ඔතප් (පවට බිය) ඇතියන් වුව මැනැවැ. අන්‍යයන් අල්පශ්‍රැත (මඳ ඇසූ පිරුතැන් ඇති) යන් වුව ද අප බහුශ්‍රැත (බොහෝ ඇසූ පිරු තැන් ඇති) යන් වුව මැනැවැ. මෙරමා කුසීතයන් වුව ද අප රුකුළ වැර ඇතියන් වුව මැනැවැ. අනුන් මුළා සිහි ඇතියන් වුව ද අප එළැඹ සිටි සිහි ඇතියන් වුව මැනැවැ. අන්‍ය පුද්ගලයන් දුෂ්ප්‍රාඥ (මඳ නුවණැති) යන් වුව ද අප ප්‍රඥ සම්පන්නයන් වුව මැනැවැ. අනුන් ස්වකීය ලබ්ධිය සිතින් දැඩි කොට අල්වා ගෙන බැහැර නො කරන පුද්ගලයන් වුව ද අප ස්වකීය

ලබ්ධිය සිතින් දැඩි කොට අල්වා නො ගෙන නුවණින් සලකත් සුවසේ බැහැර කළහැකියන් වුව මැනැවි.

මෙහි විහිංසකාදි සිවුසාලිස් කරුණු විෂයෙහි සසර බිය දක්නවුන් විසින් සල්ලෙඛය කළයුතු බව වදළ බුදු පියාණන් වහන්සේ මේ කුශලධර්මයන්හි සිත ඉපද වීම ද බෙහෙවින් උපකාර බවත් කයින් බසින් කුශලකර්මයන් කිරීමාදියෙහි අනුසස් බොහෝ බවත් වදළසේක:

(උ) එහෙයින් 'අන්‍යයෝ හිංසකයෝ වන්නාහු නමුදු ඇපි මෙහිලා අවිහිංසකයම්හ'යි සිත ඉපද වුව මැනැව. අන්නු 'පණිවා කරන්නන් වන්නාහු නමුදු ඇපි මෙහිලා පණිවා නො කරන්නම්හ'යි සිත ඉපද වූව මැනැවැ...... අන්‍යයෝ 'ස්වකීය ලබ්ධිය සිතින් දැඩි කොට අල්වා ගෙන බැහැර නො කරන්නෝ වන්නාහු නමුදු ඇපි මෙහිලා ස්වකිය ලබ්ධිය සිතින් දැඩිකොට අල්වා නො ගෙන සුවසේ බැහැර ලනු හැක්කම්හ'යි සිත ඉපද වුව මැනැවි.

මෙසේ කුශලධර්මයන්හි චිත්තොත්පාද ක්‍රමය වදරා විසම මග හැර පියා සමමග යන්නාක් මෙන් විසම තොට හැරපියා සමතොට යන්නාක් මෙන් විහිංසාදි අකුශලයන්ගෙන් දුරුවන ක්‍රමය ද මෙසේ වදරත්.

එපරිද්දෙන් ම විහිංසක (හිංසාකරන) පුහුලා හට ඉන් දුරුවනු පිණිස අවිහිංසාව වෙයි. සතුන් මරන පුහුලා හට ඉන් දුරුවනු පිණිස සතුන් මැරීමෙන් වැළකීම වෙයි. සොරකම් කරන පුහුලාහට ඉන් දුරුවනු පිණිස සොරකමින් වැළකීම වෙයි. නො බඹසැරි පුහුලා හට ඉන් දුරුවනු පිණිස නො බඹසරින් වැළකීම වෙයි. බොරු කියන පුහුලා හට ඉන් දුරුවනු පිණිස බොරුකීමෙන් වැළකීම වෙයි. කේළාම් කියන පුහුලා හට ඉන් දුරුවනු පිණිස කේළාම් කීමෙන් වැළකීම වෙයි. රළුබස් කියන පුහුලා හට ඉන් දුරුවනු පිණිස රළුබසින් වැළකීම වෙයි. හිස් තෙපුල් කියන පුහුලා හට ඉන් දුරුවනු පිණිස හිස් තෙපුලෙන් වැළකීම වෙයි. දැඩි ලෝබකම බහුල කොට ඇති පුහුලා හට ඉන් දුරුවනු පිණිස දැඩි ලෝබකම නැතිබව (අනභිද්ධ්‍යාව) වෙයි. මෙරමා නසන වනසන සිත් ඇති පුහුලා හට ඉන් දුරුවනු පිණිස අව්‍යාපාදසංඛ්‍යාත මෛත්‍රිය වෙයි. මිසදිටුගත් පුහුලා හට ඉන් දුරුවනු පිණිස සම්දිටුව වෙයි. වැරැදි අදහස් ඇති පුහුලා හට ඉන් දුරුවනු පිණිස සම්‍යක්සංකල්පය වෙයි. වැරැදි වචන ඇති පුහුලා හට ඉන් දුරුවනු පිණිස සම්‍යක් වචනය වෙයි. වැරැදි කටයුතු ඇති පුහුලා හට ඉන් දුරුවනු පිණිය සම්‍යක් කර්මාන්තය වෙයි. වැරැදි දිවිපෙවෙත ඇති පුහුලා හට ඉන් දුරුවනු පිණිස සම්‍යගාජීවය වෙයි. වැරැදි වෑයම් ඇති පුහුලා හට ඉන් දුරුවනු පිණිස සම්‍යග් ව්‍යායාමය වෙයි. වැරැදි සිහිය ඇති පුහුලා හට ඉන් දුරුවනු පිණිස මනාසිහිය වෙයි. වැරැදි සමාධිය ඇති පුහුලා හට ඉන් දුරුවනු පිණිස සම්‍යක් සමාධිය වෙයි ථිනමිද්ධයෙන් මඩනා ලද පුද්ගලයා හට ඉන් දුරුවනු පිණිස පහවූ ථිනමිද්ධය ඇති බව වෙයි. නොසන්සුන් සිත් ඇති (උද්ධත) පුද්ගලයා හට ඉන් දුරුවනු පිණිස සන්සුන් සිත් ඇති බව වෙයි. විචිකිච්ඡා සහිත පුද්ගලයා හට ඉන් දුරුවනු පිණිස තරණය කළ විසිකිස් ඇතිබව වෙයි. ක්‍රොධී පුද්ගලයාට ඉන් දුරුවනු පිණිස නො කිපෙන සුලුබව (අක්‍රොධය) වෙයි. බැඳිවෙර ඇති පුද්ගලයා හට ඉන් දුරුවනු පිණිස නො බැඳිවෙර ඇතිබව (අනුපනාහය) වෙයි. ගුණමකු පුහුලා හට ඉන් දුරුවනු පිණිස ගුණ නොමකුබව (අමක්ඛය) වෙයි. යුගග්‍රාහය ඇති පුහුලා හට ඉන් දුරුවනු පිණිස යුගග්‍රාහය නැති බව (අපළාසය) වෙයි. ඉසි කරන පුහුලා හට ඉන් දුරුවනු පිණිස ඉසි නොකරන

බව වෙයි. මසුරු පුහුලා හට ඉන් දුරු වනු පිණිස නොමසුරු බව වෙයි. කෛරාටික පුද්ගලයා හට ඉන් දුරුවනු පිණිස කෛරාටික නොවනබව (අශඨභාවය) වෙයි. මායාව ඇති පුද්ගලයා හට ඉන් දුරුවනු පිණිස අමායාව වෙයි. තද පුහුලා හට ඉන් දුරුවනු පිණිස නො තද බව වෙයි. අතිමානී පුද්ගලයා හට ඉන් දුරුවනු පිණිස අනතිමානය වෙයි. දුර්වච පුද්ගලයා හට ඉන් දුරුවනු පිණිස සුවචබව වෙයි. පව්ටු මිතුරන් ඇති පුද්ගලයා හට ඉන් දුරුවනු පිණිස කලණ මිතුරන් ඇති බව වෙයි. ප්‍රමත්ත පුද්ගලයා හට ඉන් දුරු වනු පිණිස අප්‍රමාදය වෙයි. සැදැහැනැති පුහුලා හට ඉන් දුරුවනු පිණිස ශ්‍රද්ධාව වෙයි. හිරි නැති පුහුලා හට ඉන් දුරුවනු පිණිස හිරිය වෙයි. ඔතප් නැති පුහුලා හට ඉන් දුරුවනු පිණිස ඔතප් ඇතිබව වෙයි. අල්පශ්‍රැත පුද්ගලයා හට ඉන් දුරු වනු පිණිස බහුශ්‍රැත භාවය වෙයි. කුසීත පුද්ගලයා හට ඉන් දුරුවනු පිණිස රුකුළ වැර ඇතිබව වෙයි. මුළා සිහි ඇති පුහුලා හට ඉන් දුරුවනු පිණිස එළඹ සිටි සිහි ඇතිබව වෙයි. දුෂ්ප්‍රාඥ (නුවණ නැති) පුද්ගලයා හට ඉන් දුරුවනු පිණිස ප්‍රඥ සම්පත්තිය වෙයි. ස්වකීය ලබ්ධිය හැනී ඇති දැඩිකොට අල්වාගත් බැහැර කරනට නො හැකි පුහුලා හට ඉන් දුරුවනු පිණිස ස්වකීය ලබ්ධිය හැනී නැති දැඩිකොට ගැනුම් නැති බැහැර කරනට හැකි බව වෙයි.

මෙසේ විහිංසාදි අකුශල ධර්මයන්ගෙන් දුරුවීමට පරික්‍රමණයට පවත්නා අවිහිංසාදි සිවුසාලිස් දහමුන් හෙළිකළ බුදුහු ඒ දහමුන් උපරිභාවයට - උසස් බවට කරුණු වන බව ද දෙසූහ.

විහිංසක පුද්ගලයාගේ උපරිභාවයට - උසස් බවට අවිහිංසාව වෙයි. ප්‍රාණඝාතික පුද්ගලයාගේ උසස් බවට ප්‍රාණඝාතවිරමණය වෙයි. අදින්නාදයී පුද්ගලයාගේ උසස් බවට අදත්තාදන විරමණය වෙයි....... ස්වකීය ලබ්ධිය හැනී ඇති දැඩි කොට ගැනුම් ඇති බැහැර කරනට නො හැකි බව අපහසුබව ඇති පුද්ගලයා ගේ උසස් බවට ස්වකීය ලබ්ධිය හැනී නැති දැඩි කොට ගැනුම් නැති බැහැර කරනට පහසුකම ඇති බව වෙයි.

මෙසේ අවිහිංසාදි සිවුසාලිස් දහමුන් මිහිරි විපාක ඇති කුශලධර්මයන් බැවින් සත්වයාගේ උපරිභාවයට - උසස් බවට කරුණු වන බව දෙසූ බුදුහු විහිංසාදි සියලු අකුශල ධර්මයන් පහත් බවට කරුණු බව ද වදාළහ, ඉක්බිති මේ අවිහිංසාදි කුශල ධර්මයන් ම සත්වයාගේ කෙලෙසුන් නැති කිරීමට ඉවහල් වන බව මෙසේ වදරති.

1. විහිංසකස්ස පුරිස පුග්ගලස්ස අවිහිංසා හොති පරිනිබ්බානාය,
2. පාණාතිපාතිස්ස පුරිස පුග්ගලස්ස පාණාතිපාතා වෙරමණී හොති පරිනිබ්බානාය,
3. අදින්නාදායිස්ස පුරිස පුග්ගලස්ස අදින්නාදනා වෙරමණී හොති පරිනිබ්බානාය,
4. අබ්‍රහ්මචාරිස්ස පුරිස පුග්ගලස්ස අබ්‍රහ්මචරියා වෙරමණී හොති පරිනිබ්බානාය,
5. මුසාවාදිස්ස පුරිස පුග්ගලස්ස මුසාවාද වෙරමණී හොති පරිනිබ්බානාය,
6. පිසුණාවාචස්ස පුරිස පුග්ගලස්ස පිසුණාය වාචාය වෙරමණී හොති පරිනිබ්බානාය,
7. ඵරුසවාචස්ස පුරිසපුග්ගලස්ස ඵරුසාය වාචාය වෙරමණී හොති පරිනිබ්බානාය,
8. සම්ඵප්පලාපිස්ස පුරිස පුග්ගලස්ස සම්ඵප්පලාපා වෙරමණී හොති පරිනිබ්බානාය,
9. අභිජ්ඣාලුස්ස පුරිසපුග්ගලස්ස අනභිජ්ඣා හොති පරිනිබ්බානාය,

10. බ්‍යාපන්නචිත්තස්ස පුරිස පුග්ගලස්ස අබ්‍යාපාදෙ හොති පරිනිබ්බානාය;

11. මිච්ඡාදිට්ඨිස්ස පුරිසපුග්ගලස්ස සම්මා දිට්ඨි හොති පරිනිබ්බානාය,

12. මිච්ඡා සඞ්කප්පස්ස පුරිස පුග්ගලස්ස සම්මා සඞ්කප්පො හොති පරිනිබ්බානාය,

13. මිච්ඡාවාචස්ස පුරිස පුග්ගලස්ස සම්මා වාචා හොති පරිනිබ්බානාය,

14. මිච්ඡා කම්මන්තස්ස පුරිස පුග්ගලස්ස සම්මා කම්මන්තො හොති පරිනිබ්බානාය,

15. මිච්ඡා ආජීවස්ස පුරිස පුග්ගලස්ස සම්මා ආජීවො හොති පරිනිබ්බානාය,

16. මිච්ඡාවායාමස්ස පුරිසපුග්ගලස්ස සම්මා වායාමො හොති පරිනිබ්බානාය,

17. මිච්ඡාසතිස්ස පුරිසපුග්ගලස්ස සම්මා සති හොති පරිනිබ්බානාය,

18. මිච්ඡා සමාධිස්ස පුරිස පුග්ගලස්ස සම්මා සමාධි හොති පරිනිබ්බානාය,

19. මිච්ඡාඤාණිස්ස පුරිස පුග්ගලස්ස සම්මා ඤාණං හොති පරිනිබ්බානාය,

20. මිච්ඡාවිමුත්තිස්ස පුරිසපුග්ගලස්ස සම්මා විමුත්ති හොති පරිනිබ්බානාය,

21. ථීනමිද්ධපරියුට්ඨිතස්ස පුරිසපුග්ගලස්ස විගතථීනමිද්ධතා හොති පරිනිබ්බානාය,

22. උද්ධතස්ස පුරිසපුග්ගලස්ස අනුද්ධච්චං හොති පරිනිබ්බානාය,

23. වෙචිකිච්ඡිස්ස පුරිසපුග්ගලස්ස තිණ්ණ විචිකිච්ඡතා හොති පරිනිබ්බානාය,

24. කොධනස්ස පුරිස පුග්ගලස්ස අක්කොධො හොති පරිනිබ්බානාය,

25. උපනාහිස්ස පුරිසපුග්ගලස්ස අනුපනාහො හොති පරිනිබ්බානාය,

26. මක්ඛිස්ස පුරිස පුග්ගලස්ස අමක්ඛො හොති පරිනිබ්බානාය,

27. පළාසිස්ස පුරිසපුග්ගලස්ස අපළාසෝ හොති පරිනිබ්බානාය,

28. ඉස්සුකිස්ස පුරිස පුග්ගලස්ස අනිස්සා හොති පරිනිබ්බානාය.

29. මච්ඡරිස්ස පුරිස පුග්ගලස්ස අමච්ඡරියං හොති පරිනිබ්බානාය,

30. සඨස්ස පුරිසපුග්ගලස්ස අසාඨෙය්‍යං හොති පරිනිබ්බානාය,

31. මායාවිස්ස පුරිස පුග්ගලස්ස අමායා හොති පරිනිබ්බානාය,

32. ථද්ධස්ස පුරිස පුග්ගලස්ස අත්ථද්ධියං හොති පරිනිබ්බානාය,

33. අතිමානිස්ස පුරිස පුග්ගලස්ස අනතිමානො හොති පරිනිබ්බානාය,

34. දුබ්බචස්ස පුරිස පුග්ගලස්ස සොවචස්සතා හොති පරිනිබ්බානාය.

35. පාපමිත්තස්ස පුරිසපුග්ගලස්ස කල්‍යාණමිත්තතා හොති පරිනිබ්බානාය,

36. පමත්තස්ස පුරිසපුග්ගලස්ස අප්පමාදෙ හොති පරිනිබ්බානාය,

37. අස්සද්ධස්ස පුරිසපුග්ගලස්ස සද්ධා හොති පරිනිබ්බානාය,

38. අහිරිකස්ස පුරිසපුග්ගලස්ස හිරි හොති පරි නිබ්බානාය,

39. අනොත්තාපිස්ස පුරිසපුග්ගලස්ස ඔත්තප්පං හොති පරිනිබ්බානාය,

40. අප්පස්සුතස්ස පුරිසපුග්ගලස්ස බාහුසච්චං හොති පරිනිබ්බානාය,

41. කුසීතස්ස පුරිස පුග්ගලස්ස විරියාරම්භො හොති පරිනිබ්බානාය,

42. මුට්ඨස්සතිස්ස පුරිසපුග්ගලස්ස උපට්ඨිතසතිතා හොති පරිනිබ්බානාය,

43. දුප්පඤ්ඤස්ස පුරිසපුග්ගලස්ස පඤ්ඤාසම්පද හොති පරිනිබ්බානාය,

44. සන්දිට්ඨි පරාමාසි ආධානගාහි දුප්පටිනිස්සග්ගිස්ස පුරිස

පුග්ගලස්ස අසන්දිට්ඨි පරාමාසී අනාධානගාහි සුප්පටිනිස්සග්ගිනා හොති පරිනිබ්බානාය,

මෙසේ වදාළ බුදුහු සතුනට හිංසා කරන්නාට විහිංසාව නැති කිරීමට අවිහිංසාවත්, සතුන් මරන්නාට සතුන් මැරීම නැති කිරීමට ප්‍රාණඝාත විරමණයත්, සොරකම් කරන්නාට සොරකම් කිරීම නැති කිරීමට අදත්තාදාන විරමණයත්, අබ්‍රහ්ම චාරියාට අබ්‍රහ්මචරියාව නැති කිරීමට අබ්‍රහ්මචර්‍ය්‍යා විරමණයත්, බොරු කියන්නාට බොරුකීම නැති කිරීමට මෘෂාවාද විරමණයත්, කේළාම් කියන්නාට කේළාම් කීම නැති කිරීමට පිශුනවචන විරමණයත්, රළුබස් කියන්නාට රළුබස් කීම නැති කිරීමට පරුෂවචන විරමණයත්, හිස් තෙපුල් කියන්නට හිස් තෙපුල් කීම නැති කිරීමට සම්ඵප්‍රලාප විරමණයත්, දැඩි ලොහොබියාට දැඩිලෝබකම නැති කිරීමට අනභිධ්‍යාවත්, ව්‍යාපාදසිත් ඇතියාට ව්‍යාපාදය නැතිකිරීමට අව්‍යාපාදයත්, මිසදිටු ගත්තහුට මිසදිටුව නැතිකිරීමට සම්දිටුවත්, වැරදි කල්පනා ඇතියාට මිථ්‍යා සංකල්පය නැති කිරීමට සම්‍යක් සංකල්පයත් මිථ්‍යා වචන ඇතියාට මිථ්‍යාවචනය නැති කිරීමට සම්‍යග්වචනයත්, මිථ්‍යා කර්මාන්ත ඇතියාට මිථ්‍යා කර්මාන්තය නැති කිරීමට සම්‍යක් කර්මාන්තයත්, මිථ්‍යා ආජීවය ඇතියාට මිථ්‍යා ආජීවය නැති කිරීමට සම්‍යගාජීවයත්, මිථ්‍යා ව්‍යායාමය ඇතියාට මිථ්‍යාව්‍යායාමය නැති කිරීමට සම්‍යක් ව්‍යායාමයත්, මිථ්‍යා සමෘතිය ඇතියාට මිථ්‍යා ස්මෘතිය නැතිකිරීමට සම්‍යක් ස්මෘතියත්, මිථ්‍යාසමාධිය ඇතියාට මිථ්‍යා සමාධිය නැති කිරීමට සම්‍යක් සමාධියත්, මිථ්‍යාඥනය ඇතියාට මිථ්‍යාඥනය නැති කිරීමට සම්‍යග් ඥනයත්, මිථ්‍යා විමුක්තිය ඇතියාට මිථ්‍යාවිමුක්තිය නැති කිරීමට සම්‍යග් විමුත්තියත්, ථීනමිද්ධයෙන් මඩනා ලද්දහුට ථීනමිද්ධය නැති කිරීමට විගත ථීනමිද්ධභාවයත්, සැදැහැනැතියාට අශ්‍රද්ධාව නැති කිරීමට ශ්‍රද්ධාවත්, හිරිය නැතියාට අහිරිකය නැති කිරීමට හිරියත්, ඔතප් නැතියාට අනොත්තප්පය නැති කිරීමට ඔත්තප්පයත්, අල්පශ්‍රැතයාට අල්ප ශ්‍රැතභාවය නැතිකිරීමට බහුශ්‍රැත භාවයත්, කුසීතයාට කුසීතබව නැති කිරීමට වීර්යාරම්භයත්, මුළා සිහි ඇතියාට මුළාසිහිය නැති කිරීමට එළඹ සිටි සිහි ඇති බවත්, නුවණ නැතියාට අනුවණ බව නැති කිරීමට ප්‍රඥසම්පත්තියත්, ස්වකීය දෘෂ්ටියෙන් හැනිගත් දැඩිකොට ගැනුම් ඇති බැහැර කරනට අපහසු බව ඇතියාට ඒ ලබ්ධිය නැති කිරීමට ස්වකීය දෘෂ්ටියෙන් හැනී නැති දැඩි කොට ගැනුම් නැති බැහැර කරනට පහසුබවත් ඉවහල් වන සැටි මේ පරිනිර්වාණ පර්යාය දෙශනයෙන් හෙළි කළහ.

මෙසේ මැදුම් සඟියැ මූලපරියාය වර්ගයට අයත් මේ සල්ලෙඛ සූත්‍රයෙන් වදාළ ධර්මය සසර බිය දක්නා පුද්ගලයාහට සසරින් මිදීමට උපකාර වන බව දතයුතු යි.

**සියල්ලෝ යහපත දකිත්වා.**